Boy 12, turns into girl

පිරිමි ළමයා නිවාඩුවෙන් පසු ගැහැණු ළමයෙකු වී පාසැලට එයි

(Courtesy - Sun newspaper - UK)

By BRIAN FLYNN

A BOY aged 12 turned up at school as a GIRL - after changing sex during the summer holidays.

Teachers called an emergency assembly to order fellow pupils to treat him as female.

The lad, whose parents have changed his name to a girl's by deed poll, arrived in a dress with long hair in ribboned pigtails. He is preparing for sex-swap surgery.

Angry parents told yesterday how their kids were left tearful and confused after school staff announced the boy pupil was now a girl.

They said the head teacher should have informed them in advance of the "sex change" so they could prepare their sons and daughters and inform them about gender issues. They added that the school's failure to do so had left the boy to suffer cruel taunts and bullying.

Over the summer holidays his parents changed his name to a female one by deed poll. He is preparing to undergo hormone treatment and surgery - and could become the world's youngest sex-swap patient in the coming years.

The 1,000-pupil school, in southern England, has given the lad a separate toilet and changing room in the sports hall.

It is understood he hoped his transformation would go unnoticed as he was starting secondary education and children stepping up from other primary schools would not recognise him.

But his former classmates at primary level DID spot the difference - and quickly spread the word.

Teachers stepped in with the emergency assembly, at which pupils were threatened with tough disciplinary action if they failed to treat him as a girl or use his new name. Some bewildered youngsters burst into tears.

The lad was absent from school yesterday because of the taunts. His family, who live on a council estate, have received threats and are under police protection.

දක්ෂිණ එංගලන්තයේ පාසැලක 12 හැවිරිදි පිරිමි ළමයෙකු පසුගිය මස පාසැල් නිවාඩුවෙන් පසු යළි පාසැලට පැමිණියේ කොණ්ඩය බෙදා පීරා දෙපසට රිබන් පටි දෙකකින් ගැටගසා ගැහැණු පාසැල් ඇඳුමෙන් සැරසී නියම ගැහැණු ළමයෙකු ලෙසය. ඒ ළමයාගේ නම ද දෙමාපියන් විසින් නීති මාර්ගයෙන් ගැහැණු නමකට වෙනස් කර දෙනු ලැබ ඇත. මේ ළමයා තව ටික කලකින් වයස සම්පූර්ණ වූ පසු සැබෑ ලෙසම ලිංගික භාවය වෙනස් කරන ශෛල්‍ය කර්මයකට භාජනය වී සම්පූර්ණ ගැහැණු ජීවිතය කට හැරෙන්නට දැඩි ආසාවෙන් සිටින බව කියා ඇත. බාලවයස්කාරයින්ට එවැනි සැත්කම් කිරීම දැනට බ්‍රිතාන්‍ය තුළ නීතියෙන් තහනම් ව ඇත.

ගුරුවරු අනෙක් ළමයින්ට කියා ඇත්තේ මේ පිරිමි ළමයාට දැන් ගැහැණු ළමයෙකුට මෙන් සලකන ලෙසත් හිත රිදෙන විහිළු තහළු හෝ නිර්දය කියුම් නොකියන ලෙසත්ය. එහෙත් මේ ළමයා සමහර අනෙක් ළමයින්ගේ කුරිරු හාස්‍යයට ලක්වන බව කියති. මේ සිදුවීමෙන් දෙමාපියන්ද කැළඹීමට පත්ව ඇත. ඔවුන් පාසැලට දොස් කියන්නේ මේ ලිංගික විර්යාසය ගැන කලින් නොදැන්වීම ගැනය. දෙමාපියන් කියන්නේ ලියුමකින් හෝ එය දන්වා තිබුණි නම්තම දරුවන්ට ඒ පිළිබඳව බොහෝ කරුණු කියා දී මේ ළමයාගේ තත්වය ගැන සානුකම්පිකව බලන ලෙස තම දරුවන්ට උපදෙස් දෙන්නට තමනට හැකියාව තිබුණු බව ය.

දැන් පාසැලේ මේ ළමයාට වෙනම වැසිකිළි පහසුකම් ගුරුවරුන් සපයා ඇත.

උසස් අධ්‍යාපනය සඳහා වෙනත් පාසැලකට යන විට ගැහැණු ළමයෙකු ලෙස යන්නට සිතා සිටි බවත්, ඒ නිසා ඒ කාලය එකනතුරු මේ පාසැලේදී තම සිරුරේ සිදුවන වෙනස අනෙක් ළමයින්ගෙන් සඟවාගන්නට හැකි තරම් වෙහෙස වූ නමුත් ඇතැම් ළමයින් එය තේරුම ගත් නිසා සැබෑ ස්වරූපයෙන් පෙනී සිටිය යුතුයයි තමා තීරණයක් ගත් බවත් ළමයා තම මවට කියා ඇත.

ගුරුවරු මේ උද්ගතව ඇති තත්වය ගැන සාකච්ඡා කරන්නට විශේෂ රැස්වීමක් කැඳවූහ. එහිදී ඔවුන් පාසැලේ සියළු ළමයින්ට අවවාද කළේ, ප්‍රශ්නයට මුල්වූ ළමයාට හිංසා සහගත දේ හෝ විහිළු තහළු කළොත් හෝ දැඩි විනයානුකූල පියවර ගන්නා බවය. එසේම ඒ ළමයාගේ අළුත් නම භාවිතා කරන ලෙස ද සිසුන්ට අණ කර ඇත.

එහෙත් අනෙක් ළමයින්ගේ නිරන්තර පීඩාවට ලක්ව ඇති මේම් ශිෂ්‍යයා පාසැලට නොපැමිණ සිටින දවස් ද බොහෝය. දෙමාපියන් සමග කවුන්සිල් නිවසක වෙසෙන ඔහුට අසල්වාසීන්ගෙන්ද හිරිහැර තර්ජන එන්නට පටන් ගෙන ඇති බැවින් මේ පවුලට දැන් පොලිස් ආරක්ෂාව සපයා ඇත.

British MP urges boycott of Sri Lanka goods

Siobhain McDonagh MP, Mictham & Morden, UK, during the Labour Party conference held Thursday, appealed to the delegates, and to the millions of live TV viewers, through Channel 4, to shoulder their own commitment on the Sri Lanka issue, urging that a boycott of goods and avoiding holidays in Sri Lanka. During the event, the sitting government party passed a resolution condemning " the treatment of Tamils in the island by that government."

බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ ලේබර් පක්ෂයේ සියොබාන් මැක්ඩෝනා නමැති මන්ත්‍රී ගැහැණියක් ශ්‍රීලංකා නිෂ්පාදන සියල්ල වර්ජනය කරන ලෙසත්, ශ්‍රීලංකාවට සංචාරය සඳහා නොයන ලෙසත් චැනල් 4 නාලිකාව හරහා දැන් පවතින ලේබර් පක්ෂ සම්මේලනයයේදී ඉල්ලා සිටියාය. එසේම එහිදී ශ්‍රීලංකා රජය එහි දෙමළ ජනතාවට එරෙහිව කටයුතු කරන බවත් එය ලේබර් පක්ෂය තරයේ හෙලා දකින බවත් කියන යෝජනාවකුත් එහිදී සම්මත කරගෙන ඇත.

සිනමාවේ කළණ මිතුරා හමුවීම්

තිස්ස විජේසුරේන්ද්‍ර



තිස්ස නිම්වළල්ල චිත්‍රපටයේ රූපරාමුවක

හැටේ හැත්තෑවේ දශක මැදිවියට එළඹ සිටින අප බොහෝ දෙනෙකුගේ ජීවිතවල සුන්දරතම කාල පරිච්ඡේදයයි කිවහොත් එය නිසැකවම බොහෝ අයගේ පිළිගැන්මට ලක්වන බව මම දනිමි. ඒ යුගය තුළ ලෝකයේ බොහෝ දේශයන් මෙන්ම අප රම්‍ය වූ දිවයිනද සෞන්දර්‍යයෙන් අනූන විය. සංගීතය, නාට්‍යය, ගුවන්විදුලිය, නවකතාව, පත්‍රකලාව, සිනමාව, මෙන්ම සුහදබව අතින්ද අදට වඩා යහපත් තත්වයක අපි සිටියෙමු. ඒ සියල්ලටම ඉහළින් අපි බියෙන් සැකෙන් තොරව එදා ජීවත්වුණෙමු. ජනතාව එකල වාණිජත්වයෙන් තොර සැහැල්ලු සිල්ලර ජීවිත ගත කළහ. අපේ අතින් ගිලිහී ගොස් සිහිනයක්ව පවතින ඒ දවස ගැන අද සිහිකිරීමත් සැබැවින්ම සුවදායකය.

ඒ යුගයේ මගේ මිතුරන් අදද මගේ මිතුරෝ වෙති. මම ඔවුන් ගැන බොහෝ විට කල්පනාකරමි. සමහරු කොහේ සිටිනවාදැයි කියා නොදනිමි. අවුරුදු ගණනකින් දැක නැත. මා මෙන්ම ඒ හැමද ශාරීරිකව බොහෝ වෙනස්ව ඇතුවා නිසැකය. බොහෝ දෙනෙකු අපෙන් සමුගෙන ගොසිනි. එහෙත් ඒ සුන්දර කාල පරිච්ඡේදයන් ගැන මෙනෙහි කරමින් ඒ අතීත ඉසව්වල සැරිසරන්නට මට හැකිකම තිබේ. හොඳ අතීතයක් කෙනෙකුට වී නම් වර්තමානය කොතරම් කටුක වුවද ඔහුට හිත සනසාගත හැකි ය. එය ප්‍රමාණවත් ය.



තිස්ස මේ නොබෝදා ලන්ඩනයේ පැවති ක්‍රිකට් සැණකෙළියේ දී සිය දියණියන් දෙදෙනා සමග- වමේ සුරනි සහ දකුණේ අමලි

මේ සියල්ල මා ලියුවේ මගේ අතීත මිතුරෙකු වසර තිස් පහකට පමණ පසු නොබෝදා ලන්ඩනයේදී මුණගැසීමේ සතුට පළකිරීමේ අදහසිනි. ඒ පැරණි හිතෛෂිවන්තයා ප්‍රකට සිනමා කලාකරු තිස්ස විජේසුරේන්ද්‍රයි.

හැත්තෑවේ දශකයේ අපේ රිදීතිරය ඔප කළ, යොවුන් සිනමා රසිකාවියන් ගේ හෘදස්පන්දනය දුටු මනතින් නවතා ලන්නට සමත් වූ අතිශය සෙනෙහෙබර මුහුණවරකින් යුත් ඔහු තිරයට පිවිසියේ පාසැල් ශිෂ්‍යයෙකු කාලයේදීම ය.

තිස්ස හා පුරා කියා සිනමාවට පිවිසියේ කළණ මිතුරෝ චිත්‍රපටයෙනි. අභාවප්‍රාප්ත කිංස්ලි රාජපක්ෂ අධ්‍යක්ෂණය කළ **කළණමිතුරෝ** අපේ සිනමා වංශයේ 224 වන චිත්‍රපටයයි. එය 1971 මාර්තු මස තිරගත විය. කළණ මිතුරෝ ඒ කාලයේ ඉන්දියාවේ ජනප්‍රිය හින්දි චිත්‍රපයටයක් වූ දෝස්ති අනුව තනන ලද්දකි. දෝස්ති මෙන්ම කළණ මිතුරෝද ශ්‍රීලංකාවේ ජනප්‍රිය වූ බව මට මතකය.

ඉන්පසු තිස්සට පෙම්වතාගේ චරිතය සඳහා ඉල්ලුම වැඩිවිය. එකල සිනමාවේ ජය කෙහෙළි බැඳ සිට අසහාය නළු ගාමිණී පොන්සේකා මෙන්ම තවත් ජනප්‍රිය සිනමා ආදරවන්තයෙකුව සිටියේ විජය කුමාරතුංගයි. එකල චිත්‍රපට අධ්‍යක්ෂකවරු, නිශ්පාදකවරු හඹා ගියේ ජනප්‍රිය නළු නිළියන් පසුපසය. එසේම එම කාලපරිච්ඡේදය අපේ සිනමා කර්මාන්තයට ද අද මෙන් නොව ඉතා වැඩ අධික කාලයකි. චිත්‍රපට දිව්වේ බොක්ස් ඔෆීස් වාර්තා බිඳ හෙළමිනි. ගාමිණී විජය හා තිස්ස ඒ යුගයේ අපේ සිනමාවේ අතිශය කාර්‍යබහුල නළුවෝ වූහ.

තිස්ස සිංහල චිත්‍රපට පණස් ගණනක රඟ පා ඇත. ඉන් බොහොමයක් අධික ආදායම් වාර්තා තැබූ ජනප්‍රිය චිත්‍රපට වූහ. මාලිනී පොන්සේකා, ගීතා කුමාරසිංහ, ශ්‍රියානි අමරසේන, සුමනා අමරසිංහ ආදී ඒ යුගයේ ජනප්‍රිය ප්‍රවීන නිළියන් සමග ප්‍රධාන චරිත රඟපෑවා පමණක් නොව අප සිනමා-වේ අසහාය නිළි රුක්මණී දේවී සමගද තිස්ස තිරයේ චරිත නිරූපණය කර තිබේ.

සුහද පැතුම, ළසදා, සිනාවයි ඉනාවයි, සුරේකා, ලස්සන කෙල්ල, සාධනා, සෙනෙහ-සක කඳුළු හා අනුෂා තිස්ස රඟපා ඇති චිත්‍රපට වලින් කීපයකි.

1971 දී පමණ තිස්ස ගැන පුවත්පතකට ලිපියක් ලියන්නට දෙහිවල නැදිමාලේ එකල ඔහු දෙමව්පියන් හා සහෝයුරන් දෙදෙන සමග පදිංචිව සිටි නිවසට ගොස් හමුවීමි. එදා සිට තිස්ස මගේ සමීප මිතුරෙකු වීය. ඒ සමීප ඇසුර මා ලන්ඩනයට එන්නට කිට්ටු කාලය දක්වාම පැවතියේය. ගතවූ වසර තිහක කාලයේ මා බොහෝ වරක් ශ්‍රීලංකාවට ගියේ වී නමුදු කෙසේ හෝ මට තිස්ස හමුවුනේම නැත.

තිස්ස විවාහ වූයේ කොළඹ විශාඛා විදුහලේ ආචාර්‍යවරියක වන සාවිත්‍රී ඩයස් සමගය. එය ප්‍රේම සම්බන්ධයක් මුල්වූ විවාහයකි. ඔවුන්ට දියණියන් තිදෙනෙකි. වැඩිමහල් දුව අමාලි දැන් එංගලන්තයේ නෝත්හැම්ප්ටන් හි වාසය කරයි. ඇයගේ සැමියා ශ්‍යාන්ය. දෙවැනි දුව සුරනි ලන්ඩනයේ හෙන්ඩන්හි වෙසේ. ඇය විවාහ වී සිටින්නේ හිරාන් විජේරත්න සමගය. හිරාන් සංගීතඥයෙකු ලෙසද ලන්ඩනයේ ශ්‍රීලාංකිකයින් අතර ජනප්‍රිය චරිතයකි. තුන්වැනි දුව උදයන්ති ශ්‍රීලංකාවේ ය. ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ බීඑස්සී උපාධිධාරිනියක වන ඇය දැන් ගණකාධිකරණය හදාරයි.

තිස්ස දෙමසකට පෙර ලන්ඩනයට පැමිණ සිටියේ මෙහි සිටින දියණියන් දෙදෙනා සහ ඔවුන්ගේ දරුවන් බලන්නටය. දෙවෙනි දුව සුරනිගේ ගෙදර සිට ඔහු මා ඇමතූ කල වසර තිහකට පසුව වුවද මට ඒ සුපුරුදු කටහඬ හඳුනාගත හැකි වීය. එහි වෙනසක් නැත

තිස්ස ඔහුගේ ලන්ඩනයේ මිනිපිරියන් දෙදෙනා සමග

පසුදා මම තිස්ස හමුවන්නට සුරනි දුවගේ ගෙදර ගියෙමි. ඉමහත් සොම්නසින් යුතුව ඔහු මා පිළිගත්තේය. අපි බොහෝ දේ කතා කළෙමු. අතීත සිනමාව මෙන්ම වර්තමාන සිනමාව, දැන් බිඳ වැටී ඇති අපේ සිනමා කර්මාන්තය, මේවා අපි සාකච්ඡා කළෙමු. බොහෝ ඉහත මා දැක සිටි සෙල්ලක්කාර තරුණයාට වඩා වඩාත් පරිණත මිනිසෙකු මම ඔහු තුළින් දුටුවෙමි. කාලය කොපමණ වෙනසක් කර ඇද්ද? එහෙත් හිතවත්කම එලෙසමය. තවමත් අපට ඉතුරුව ඇත්තේ අපේ සහෘදයින්ගේ ඒ හිතවත්කම් පමණි. එය මෙනෙහි කිරීමත් හිතට සහනයක් නොවේද? ♦ ***දයා ආනන්ද***